

# 03 මානව හිමිකම් හා යුතුකම්

## හැඳින්වීම

මිනිසුන් ලෙස උපත ලැබූ සෑම කෙනෙකුට ම මානව ගරුත්වයෙන් හා සමාන අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතියක් ඇත. කිසිවෙක් උපතින් උසස් හෝ පහත් තත්ත්වයකට පත් නොවේ. එහෙත් ලෝකයේ විවිධ රටවල මිනිසුන් විඳින තාඩන, පීඩන, හිරිහැර, කෲර, අමානුෂික වධ හිංසා පිළිබඳ ව නිරන්තර ව ම අසන්නට, දකින්නට ලැබේ.

මිනිස් ඉතිහාසයේ මුල් කාලයේ දී මානව අයිතිවාසිකම් පිළිබඳ ව වැඩි අවධානයක් යොමු නොවුණි. එහෙත් මිනිසා දියුණු වීමත් සමඟ තවත් කෙනෙකුගෙන් තම අයිතිවාසිකම් කඩවන බව හෝ අසමාන සැලකිලි ලැබෙන බව අවබෝධ වීමෙන් පසු ව මිනිසා තම අයිතිවාසිකම් රැක ගැනීම සඳහා උනන්දු විය. ඒ සඳහා බලපාන ලද ප්‍රධාන කරුණක් ලෙස මිනිසා තවත් මිනිසකුගේ හෝ කණ්ඩායමකගේ වහලෙකු ලෙස නොසැලකිය යුතු යැ යි පිළිගැනීම ය. ඉතා සීමිත හා මූලික අවශ්‍යතා පමණක් ලබා දෙමින් වහල් හිමියන් මිනිසුන් වහල් සේවයෙහි, දාසකමෙහි යොදා ගැනීම නිසා මිනිස් අයිතිවාසිකම් බිඳ වැටීම ප්‍රබල විය. මෙය ක්‍රමයෙන් වහල් යුගයේ පටන් වැඩවසම්, ධනවාදී, සමාජවාදී යන අර්ථක්‍රම ඔස්සේ ක්‍රියාත්මක වූ අතර මිනිස්සු තම අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා විවිධ අරගලවල නිරත වූහ. අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා කටයුතු කළ ඉතිහාසයට අදාළ උදහරණ කිහිපයක් පහත දැක්වේ.

- ක්‍රි.ව. 1215 දී බ්‍රිතාන්‍යයේ මැග්නා කාර්ටා ගිවිසුම
- ක්‍රි.ව. 1679 දී හබායස් කෝපුස් ආඥාව
- ක්‍රි.ව. 1689 දී බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය
- ක්‍රි.ව. 1776 දී ඇමෙරිකානු නිදහස් ප්‍රකාශනය
- ක්‍රි.ව. 1789 දී මිනිස් හා පුරවැසියන් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශනය
- ක්‍රි.ව. 1791 අයිතිවාසිකම් පිළිබඳ ඇමෙරිකානු ප්‍රඥප්තිය
- ක්‍රි.ව. 1917 රුසියානු විප්ලවය
- ක්‍රි.ව. 1948 මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය

මෙයට අමතර ව ලෝකය පුරා විවිධ රටවල මිනිස් අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා විවිධ අරගල ක්‍රියාත්මක කරනු ලැබිණි.

අයිතිවාසිකම් පිළිබඳ ව විමසීමේ දී එක්වර ම මතකයට නැගෙන්නේ මිනිසුන්ට හිමිවිය යුතු අයිතිවාසිකම් පිළිබඳ ව යි. එහෙත් මිනිසුන්ට මෙන් ම ජීව අජීව බොහෝ දේ පැවැත්ම සඳහා ද අයිතියක් තිබේ. වන සතුන්, ගස්වැල්, ගංගා, ඇළ දොළ, සාගරය ඇතුළු ව පරිසරයට ද යහ පැවැත්ම සඳහා අයිතියක් තිබේ. අපට පරිසරය සුරක්ෂිත කිරීම පිළිබඳ ව යුතුකමක් පැන නගින්නේ එබැවිනි. එලෙස ම මානව හිමිකම් ආරක්ෂා කිරීම ප්‍රධාන යුතුකමක් බවට පත් ව තිබේ.

මානව අයිතිවාසිකම් සදාචාරාත්මක සංකල්පයකි. එය හොඳ නරක හෝ යහපත් අයහපත් දේ සමඟ බැඳී පවතී. එක් ජන සමාජයක් හොඳ හෝ යහපත් යැ යි පිළිගන්නා දෙයක් තවත් ජන සමාජයක නරක හෝ අයහපත් ලෙස ප්‍රතික්ෂේප කළ හැකි ය. ඒ නිසා අයිතිවාසිකම් ලෙස දක්වන කරුණු එකිනෙක සමාජ පිළිගැනීම් මත වෙනස් විය හැකි ය. එහෙත් මෙහි දී මානව අයිතිවාසිකම් ලෙස විමසීමට භාජනය කෙරෙන්නේ පොදුවේ සියලු ජන සමාජ පිළිගන්නා සර්ව සාධාරණ අයිතිවාසිකම් සමූහයකි. ඒ අනුව **"සෑම මනුෂ්‍යයකුට ම තිබිය යුතු යැ යි සැලකෙන හිමිකම් මානව අයිතිවාසිකම්"** ලෙස හැඳින්විය හැකි ය. මෙලොව උපන් සෑමට පොදුවේ හිමිවිය යුතු අයිතිවාසිකම් සමූහයක් මානව හිමිකම් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී තිබේ. මෙහි දී කිසිදු භේදයක් නොසැලකේ. ජන වර්ගය, ලිංග භේදය, ජාතිය, ආගම, කුලය, පන්තිය, ගෝත්‍රය, ආර්ථික මට්ටම, සමාජ තත්ත්වය ආදී කිසිදු වෙනසක් මෙයට අදාළ නො වේ. මෙම අයිතිවාසිකම් සෑම මනුෂ්‍යයකුගේ ම යහපත සඳහා අත්‍යවශ්‍ය වන බව පිළිගෙන තිබේ. ප්‍රජාතන්ත්‍රවාදය, සුභසාධනය, පුරවැසියන්ගේ සුභසිද්ධිය සඳහා අයිතිවාසිකම් පිළිගැනීම හා සුරක්ෂිත කිරීම සියලු දෙනාගේ ම යුතුකමක් ද වේ.

අයිතිවාසිකම් සදාචාරාත්මක සංකල්පයක් වුවත් වර්තමානයේ එය නීතිමය පදනමක් හිමි කරගෙන තිබේ. නිදහස් ව නිවහල් ව ජීවත්වීම සඳහා බොහෝ විට අයිතිවාසිකම් ඉල්ලා සිටීම දැකිය හැකි ය. එනිසා අයිතීන්, අයිතීන් ඉල්ලා සිටින්නන් සහ ලබා දීමට බැඳී සිටින්නන් වශයෙන් අයිතිවාසිකම් ක්‍රියාවලිය කරුණු තුනකින් සමන්විත වේ.

බොහෝ විට රටක හෝ සමාජයක පාලිතයන් අයිතිවාසිකම් ඉල්ලා සිටින්නන් වන අතර, පාලකයෝ හෝ රජය අයිතිවාසිකම් ලබා දීමට බැඳී සිටින්නෝ වෙති.

මානව අයිතිවාසිකම් අපක්ෂපාති වේ. ඒවා සියල්ලන්ට ම පොදු ය. එමෙන් ම අයිතිවාසිකම් සැමට සමාන ය. ඒවා සාධාරණ හා යුක්ති සහගත වේ. සැම ආගමක් ම එවැනි අයිතීන් ගරු කරනු ලැබේ. මානව ගරුත්වයෙන් හා සමානාත්මතාවයෙන් ජීවත්වීම සඳහා සැම මිනිසකුට ම මානව අයිතිවාසිකම් පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම වැදගත් ය.

## අයිතිවාසිකම් වර්ග කිරීම

මානව අයිතිවාසිකම්

- මූලික අයිතිවාසිකම්
- කාන්තා අයිතිවාසිකම්
- ළමා අයිතිවාසිකම්

මානව අයිතිවාසිකම් ලෝකයේ බොහෝ රටවල් තම මූලික නීතියට ද ඇතුළත් කර තිබේ. එවැනි මානව අයිතිවාසිකම් මූලික අයිතිවාසිකම් ලෙස හඳුන්වයි.

මෙයට අමතර ව මානව අයිතිවාසිකම්වල ම කොටස් ලෙස එහෙත් සුවිශේෂී ව සාකච්ඡා කෙරෙන අයිතිවාසිකම් වර්ග දෙකකි. එනම් කාන්තා අයිතිවාසිකම් හා ළමා අයිතිවාසිකම් වේ.

මානව අයිතිවාසිකම් පොදුවේ සලකා බලා කොටස් කිහිපයකට බෙදා තිබේ. එහි එක් බෙදීමක් වන්නේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් වේ. අනෙක් බෙදීම ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් ලෙස වේ. (වගුව 3.1 බලන්න).

## මානව අයිතිවාසිකම්

**සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්**


- ☆ හෘදය සාක්ෂිය පිළිබඳ අයිතිය වහල්භාවයෙන්, දාසභාවයෙන් මිදීමට ඇති අයිතිය
- ☆ කෲර, අමානුෂික, අවමන් සහගත සැලකිලිවලින් මිදී සිටීමේ අයිතිය
- ☆ සාධාරණ නඩු විභාගයට ඇති අයිතිය
- ☆ රහස්‍යභාවයට හා ආරක්ෂාවට ඇති අයිතිය
- ☆ තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය
- ☆ ප්‍රජාතන්ත්‍රවාදී ව කටයුතු කිරීමේ අයිතිය
- ☆ මාධ්‍ය භාවිතයට ඇති අයිතිය
- ☆ කැමැති මතයක් දැරීමට ඇති අයිතිය
- ☆ ඡන්දදායකයකු හෝ අපේක්ෂකයෙකු ලෙස කටයුතු කිරීමට ඇති අයිතිය

**ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම්**

- ☆ නීත්‍යානුකූල රැකියාවක යෙදීමේ අයිතිය
- ☆ නිදහස් ශ්‍රමය සැපයීමට ඇති අයිතිය
- ☆ සාධාරණ වැටුපක් ලැබීමේ අයිතිය
- ☆ සමාජ රක්ෂණය හා සමාජ ආරක්ෂණයට ඇති අයිතිය
- ☆ උසස් ම ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයක් භුක්ති විඳීමේ අයිතිය
- ☆ වෘත්තීය සමිතිවලට බැඳීමේ අයිතිය
- ☆ නොමිලයේ අනිවාර්ය අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය
- ☆ සංස්කෘතික, විද්‍යාත්මක හා කලාත්මක කටයුතුවලට සහභාගීවීමේ අයිතිය
- ☆ යහපත් ජීවන තත්ත්වයක් වර්ධනය කර ගැනීමට ඇති අයිතිය

3.1 වගුව

මානව අයිතිවාසිකම් සිවිල්, දේශපාලන, ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් ලෙස වර්ග කිරීම ද සාමාන්‍යයෙන් සිදු වේ. රූප සටහන 3.2 බලන්න.





**3.2 රූප සටහන**

මෙසේ අයිතිවාසිකම් වර්ග කර දැක්වුව ද මෙම අයිතිවාසිකම් එකිනෙක බැඳී පවතී. එම නිසා මානව අයිතිවාසිකම් නොබෙදිය හැකි විශ්ව සංකල්පයක් ලෙස සැලකේ.

මිනිස් අයිතිවාසිකම් බිඳ වැටීම සම්බන්ධයෙන් වූ කැපී පෙනෙන අවස්ථාවක් ලෙස පළමුවන ලෝක සංග්‍රාමය හැඳින්විය හැකි ය. අතිවිශාල ජීවිත සංඛ්‍යාවක් විනාශ කරමින් සිදු වූ පළමුවන ලෝක සංග්‍රාමය නිම වී වැඩිකල් යන්නට පෙර දෙවන ලෝක

සංග්‍රාමය ද ඇති විය. යුද්ධයෙන් අතිවිශාල ජීවිත හා දේපළ විනාශ විය. යුද්ධයට කිසිදු සම්බන්ධයක් නැති අහිංසක දරුවෝ, කාන්තාවෝ හා මිනිස්සු ලක්ෂ සංඛ්‍යාත පිරිසක් මරණයට පත් වූහ. තවත් එවැනි ම සංඛ්‍යාවක් විවිධ ආබාධවලට ගොදුරු වූහ. මෙහි අවසාන ප්‍රතිඵලය වූයේ නැවත එවැනි විනාශයක් ඇති නොවීම සඳහා ක්‍රියාත්මක වීමට ලෝක ජනතාව එකට එකතු වීම යි. මිනිස් අයිතිවාසිකම් සුරැකීමට සහ ලෝක යුධ තත්ත්ව වළක්වා ගැනීම සඳහා ජාතීන් එක් ව ක්‍රියාකිරීමේ වැදගත්කම සියලු ම ජාතීන් අවබෝධ කර ගෙන තිබුණි. මේ කෙරෙහි අවධානය යොමු කරමින් එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවා ගැනීම සිදු විය. මානව හිමිකම් සුරක්ෂිත කිරීම හා ලෝක සාමය උදා කිරීම එහි ප්‍රධාන අරමුණු විය.

එක්සත් ජාතීන් විසින් තම ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීම සඳහා 1948 දෙසැම්බර් 10 දින මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයක් සම්මත කරනු ලැබිණි. මෙය ලෝක ඉතිහාසයට එක් වු ඉතා වැදගත් ලියවිල්ලකි. සියලු මිනිසුන්ට ගරුත්වයෙන් හා සමානාත්මතාවයෙන් ජීවත්වීමේ අයිතිය තහවුරු කරමින් සාමාජික රටවල එකඟතාවක් ඇතිකර ගැනීම මෙ මගින් සිදු විය. එය ලොව ප්‍රථම වරට බිහිකරගත් මානව අයිතිවාසිකම් පිළිබඳ විශිෂ්ට ලේඛනයකි.



### ක්‍රියාකාරකම් - 1

ලොව විවිධ රටවල මානව අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු රැස් කරන්න. යුතුකම් ඉටු කරන සමාජයක් ගොඩනැගීම සඳහා ඒවායින් ගත හැකි ආදර්ශ මොනවා ද?

### ක්‍රියාකාරකම් - 2

එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීම සඳහා බලපෑ කරුණු පිළිබඳ ව ලේඛනයක් සකස් කරන්න. එවැනි සංවිධානයක අවශ්‍යතාව අද සමාජයට කොතරම් වැදගත් දැ යි සාකච්ඡා කරන්න.

# එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය

"ලෝකයේ පවත්නා නිදහස, යුක්තිය හා සාමය යන්නෙහි පදනම මිනිස් පවුලේ සියලු දෙනාගේ ම සහජ ගරුත්වය සහ අන්සතු කළ නොහැකි වූ සම අයිතිවාසිකම් පිළිගැනීම යි."

මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයක් ලොවට ඉදිරිපත් කරමින් එහි පූර්විකාවෙහි දක්වා ඇති ඉහත ප්‍රකාශය ඉතා වැදගත් වේ. ගරුත්වය සහ සම අයිතිවාසිකම් සෑම මනුෂ්‍යයකුට ම සාධාරණ වේ. නිදහස, යුක්තිය සහ සාමයට ද පදනම ඒ තුළින් සැපයේ. 1948 දෙසැම්බර් මස 10 දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරන ලද මෙම විශ්ව ප්‍රකාශය කිසිදු භේදයකින් තොර වූ සර්ව සාධාරණ ලියවිල්ලකි. එය පූර්විකාවකින් සහ වගන්ති 30 කින් සමන්විත වේ.

මෙම විශ්ව ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණු කිහිපයක් පිළිබඳ ව එහි පූර්විකාවේ සඳහන් වේ.

- නීති මඟින් මානව හිමිකම් ආරක්‍ෂාකර දීම අත්‍යවශ්‍ය බව.
- ජාතීන් අතර මිත්‍ර සබඳතා තව දුරටත් වර්ධනය කිරීම අත්‍යවශ්‍ය බව.
- සමාජ ප්‍රගතිය හා වඩා යහපත් ජීවන තත්ත්වයක් උදාකර දීම.

"මිනිස් වර්ගයාට අදහස් ප්‍රකාශ කිරීමේ හා විශ්වාස ඇදහිලි දැරීමේ නිදහසත් බියෙන් හා අගහිඟකමින් තොර වීමේ නිදහසත් භුක්ති විඳීමට හැකි ප්‍රජාවක් බිහි කිරීම පොදු ජනතාවගේ ශ්‍රේෂ්ඨතම අපේක්‍ෂාව යි."

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයෙහි ඇතුළත් වගන්ති 30 කි. එහි සාරාංශයක් පහත දැක්වේ.

1. සියලු මනුෂ්‍යයෝ නිදහස් ව උපත ලබති. ගරුත්වය හා අයිතිවාසිකම් වලින් සමාන වේ.

2. කිසිදු භේදයකින් තොර ව විශ්ව ප්‍රකාශයේ අයිතිවාසිකම් සැමට සමාන ව හිමි වේ.

3. ජීවත්වීමට, සිතීමට හා පෞද්ගලික ආරක්‍ෂාවට ඇති හිමිකම.

4. කිසිවෙකු වහල් භාවයේ (දාසකමේ) නොයෙදිය යුතු බව. වහල් වෙළෙඳම හා වහල්කම තහනම් බව.

5. කිසිම පුද්ගලයකු වධ හිංසාවට හෝ කෲර අමානුෂික දඬුවමකට යටත් නොකළ යුතු බව.

6. නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස පිළිගැනීමේ අයිතිය.

7. නීතිය ඉදිරියේ සියල්ලන් ම සමාන බව සහ නීතියේ ආරක්‍ෂාවට සියල්ලන්ට ම හිමිකමක් ඇති බව.

8. මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමේ දී ප්‍රතිකර්ම යොදා ගැනීමේ හිමිකම.

9. බලහත්කාරයෙන් අත් අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම හෝ පිටුවහල් කිරීම නොකළ යුතු බව.

10. සාධාරණ හා අපක්‍ෂපාතී නඩු විභාගයකට ඇති හිමිකම.

11. i. වරදකරුවකු බව ඔප්පුවන තෙක් නිර්දෝෂී පුද්ගලයකු ලෙස සැලකීම.

    ii. දණ්ඩන වරද කළ කාලයේ පැවති දඬුවමකට වඩා වැඩි දඬුවම් නියම නොකළ යුතු බව.

12. පෞද්ගලික රහස්‍යභාවයට ඇති අයිතිය.

13. i. තම රාජ්‍ය සීමාව තුළ නිදහස් ගමනාගමනයට හා පදිංචියට හිමිකම.

    ii. විදේශගත වීමට හා තම රටට ආපසු පැමිණීමට ඇති අයිතිය.

14. ජීවිතාරක්ෂාව සඳහා විදේශගත වීමේ හිමිකම.

15. සෑම පුද්ගලයකුට ම ජාතිකත්වයට හිමිකම් ඇති බව.

16. පවුලක් ඇති කිරීමේ හා පවුල සමාජයෙන් හා රාජ්‍යයේ රැකවරණය ලැබීමේ අයිතිය.

17. දේපළ පිළිබඳ අයිතිය.

18. සිතීමේ, හෘද සාක්ෂියේ හා ආගමික නිදහස භුක්ති විඳීමේ අයිතිය.

19. නිදහස් මතය ප්‍රකාශ කිරීමට හා තොරතුරු ලැබීමේ අයිතිය.

20. සාමකාමී ව එක්රැස්වීමේ හා සංගම් පැවැත්වීමේ අයිතිය.

21. රජයට සහභාගී වීමට, ඡන්ද බලයට හා රාජ්‍ය සේවයට ඇති අයිතිය.

22. සමාජ ආරක්ෂාවේ අයිතිය.

23. රැකියාවක් කිරීමට, සාධාරණ වැටුප් ලැබීමට හා වෘත්තීය සමිතිවලට බැඳීමේ අයිතිය.

24. නිවාඩු සහ විවේක ගැනීමේ අයිතිය.

25. සමාජ සේවා ආරක්ෂාව හා රැකවරණයට අයිතිය.

26. අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය.

27. සංස්කෘතික, විද්‍යාත්මක හා කලා කටයුතුවලට ඇති අයිතිය.

28. අයිතිවාසිකම් හා ස්වාධීනතා පරිපූර්ණ ව ඉටු කරගත හැකි සමාජ හා ජාත්‍යන්තර රටාවකට ඇති අයිතිය.

29. සෑම පුද්ගලයකු විසින් ම ඉටුකළ යුතු සමාජ යුතුකම් රැසක් ඇති බව.

30. ප්‍රකාශයෙහි ඇති අයිතිවාසිකම් හෝ ස්වාධීනතා වැනසී යන අන්දමේ ක්‍රියාකාරකම් නොකළ යුතු බව.

එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයෙන් පසු ව එහි ඇතුළත් කරුණු සම්බන්ධයෙන් නීත්‍යානුකූල බවක් ඇති කිරීමට සහ ඒ පිළිබඳ ව සාමාජික රටවල අවධානය යොමු කිරීම සඳහා තවත් සම්මුතීන් දෙකක් ඇති විය. 1966 දෙසැම්බර් 16 දින සම්මත කරන ලද මෙම සම්මුතීන් දෙක පහත දැක්වේ.

### 1. ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය :

විශ්ව ප්‍රකාශයෙහි ඇතුළත් ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් වෙන ම සම්මුතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මෙය සම්මත කර ඇත. සම්මුතිය කොටස් පහකින් සමන්විත වේ. වගන්ති 31 ක් ඇතුළත් කර ඇත. මෙම සම්මුතිය සාමාජික රටවල් අත්සන් කොට ස්ථිර කිරීමෙන් පසු ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම්වලට නීතිමය තත්ත්වයක් ලැබේ.

### 2. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය :

එක්සත් ජාතීන් විසින් 1966 දෙසැම්බර් 16 දින සම්මත කළ දෙවැනි සම්මුතිය මෙය යි. මෙම සම්මුතිය ද කොටස් පහකින් යුක්තවන අතර, වගන්ති 53 ක් ඇතුළත් කර ඇත. සාමාජික රටවල් අත්සන් කොට ස්ථිර කිරීමෙන් පසු සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ මෙම සම්මුතියට නීතිමය තත්ත්වයක් ලැබේ.

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය සම්මත කර ගැනීමෙන් පසු ව එයට අදාළ ව පසුකාලීන ව තවත් වෛකල්පික ගිවිසුම් දෙකක් සම්මත කර ගැනීම සඳහා එක්සත් ජාතීන් විසින් කටයුතු කරනු ලැබිණි. මෙය, සම්මුතියට අතිරේක වශයෙන් එය තව දුරටත් ශක්තිමත් කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියා මාර්ගයකි. එම වෛකල්පික ගිවිසුම් දෙක පහත දැක්වේ.

## 1. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ වෛකල්පික ගිවිසුම.

මෙම වෛකල්පික ගිවිසුම වගන්ති 14 කින් සමන්විත වේ. මෙ මගින් කිසියම් මානව හිමිකමක් කඩ වූ විට ඒ සම්බන්ධ ව තමන්ගේ රටේ යුක්තිය පසිඳලීමේ කාර්යයන් අවසන් වූ පසු ව ඉන් සෑහීමකට පත් නොවන්නේ නම් මෙම සම්මුතිය යටතේ පිහිටුවා ඇති මානව හිමිකම් කමිටුවට පැමිණිලි කිරීමේ හැකියාව ලැබේ. ඒ සඳහා අදාළ රට වෛකල්පික ගිවිසුමට අත්සන් තබා පිළිගෙන තිබිය යුතු ය. ශ්‍රී ලංකාව ගිවිසුම පිළිගෙන ඊට අත්සන් තබා තිබේ. එබැවින් මානව හිමිකම් කඩවීම් සම්බන්ධ ව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවට පැමිණිලි කිරීමේ හැකියාව ලැබී තිබේ.

## 2. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියට එකතු කළ දෙවැනි වෛකල්පික ගිවිසුම.

මෙය 1989 දෙසැම්බර් 15 දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කර ඇත. මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 03 වැනි වගන්තිය හා සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියේ 6 වැනි වගන්තියට අතිරේක වශයෙන් මෙය ඉදිරිපත් කර ඇත. වගන්ති 11 කින් සමන්විත වෛකල්පික ගිවිසුම මගින් මරණ දඬුවම අහෝසි කිරීමට කටයුතු කර ඇත. මෙම ගිවිසුමට අත්සන් කර පිළිගන්නා සාමාජික රාජ්‍යයක් කිනම් හෝ වරදක් සම්බන්ධයෙන් වරදකරුවකු වන කිසිදු පුද්ගලයකුට මරණ දඬුවම නියම කිරීම තහනම් කෙරේ. ශ්‍රී ලංකාව මෙතෙක් මෙම ගිවිසුමට අත්සන් තබා නැත. වෛකල්පික ගිවිසුම පිළිබඳ ව ඡන්ද විමසීමේ දී එයට පක්ෂ ව රටවල් 56 ක් ද විපක්ෂ ව රටවල් 26 ක් ද ඡන්දය පාවිච්චි කර තිබුණි. සාමාජිකයන් 48 දෙනෙක් ඡන්ද දීමෙන් වැළකී සිට ඇත. මෙම ගිවිසුම 1991 ජුලි මාසයේ 11 දින සිට වලංගු භාවයට පැමිණ තිබේ.

## අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පනත

අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පනත නමින් හැඳින්වෙන්නේ මීට පෙර සාකච්ඡා කරන ලද විශ්ව ප්‍රකාශනය, සම්මුති දෙක හා වෛකල්පික ගිවිසුම් දෙකේ එකතුව යි. මෙම ලේඛන සියල්ල එක් ව ගත්විට එය මානව අයිතිවාසිකම් පනත ලෙස හඳුන්වනු ලැබේ. ඒ අනුව එහි කොටස් 5 කි.

1. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (1948)

2. ආර්ථීක, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය (1966)

3. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (1966)

4. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ වෛකල්පික ගිවිසුම (1966)

5. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ දෙවැනි වෛකල්පික ගිවිසුම (1989)

**ක්‍රියාකාරකම් - 3**

"ජීවත්වීමේ අයිතිය සැමට සමාන ය" යන මැයෙන් බිත්ති පුවත් පතකට වාර්තාවක් සකස් කරන්න. ඒ සඳහා මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය පදනම් කර ගන්න.




## කාන්තා අයිතිවාසිකම්

කාන්තාවන්ට ද පිරිමින්ට මෙන් ම සමාන වූ අයිතිවාසිකම් හා ගරුත්වයක් සදාචාරාත්මක සමාජයෙහි ලැබී තිබේ. මනුෂ්‍යයකු කාන්තාවක් වශයෙන් ඉපදීම, සමාජයෙන් කොන් කිරීමට, අවතක්සේරුවට ලක් කිරීමට හෝ පහත් කොට සැලකීමට හේතුවක් නොවේ. එමෙන් ම ඈ කෙරෙහි ප්‍රචණ්ඩත්වය මුදා හැරීම, හිංසනයට ලක් කිරීම, අතවර කිරීම, අවමන් කිරීම නොකළ යුතු ය. ක්‍රි. පූ. 6 වන සියවසේ දඹදිව සිටි ලිච්ඡවි රජ දරුවන් විසින් අනුගමනය කළ සප්ත අපරිහානිය ධර්මවලින් කරුණු දෙකක් ම ඇතුළත් වන්නේ කාන්තාවන් සම්බන්ධයෙනි.

- අවිවාහක කුල කුමරියන් ආරක්ෂා කිරීම.
- විවාහක කුල කාන්තාවන් ආරක්ෂා කිරීම.

ඉතා ඈත අතීතයේ දී පවා කාන්තාව කෙරෙහි දක්වූ සැලකිල්ල එතරම් උසස් මට්ටමක පැවතියේ, සමාජයේ කාන්තාව ශ්‍රේෂ්ඨ වූ මව් පදවියට ද හිමිකම් කියන හෙයිනි. එමෙන් ම අවිවාහක හා විවාහක කාන්තාවන් ආරක්ෂා කිරීම, ඔවුන්ට රැකවරණ සැලසීම, ගෞරව කිරීම, සමාජ සංවර්ධනයට හේතුවන ශ්‍රේෂ්ඨ ධර්මතාවකි.

උපතින් ස්ත්‍රියක හෝ පුරුෂයකු වීම නිසා ම සමාජයේ සුවිශේෂි භාවයක් හිමි නො වේ. එහෙත් ආසියාතික රටවල පවතින සංස්කෘතික ස්වභාවය අනුව ස්ත්‍රියකට සමාජයේ සුවිශේෂී රැකවරණයක් සමාජය තුළින් ම සැලසී තිබේ. දූරියක ලෙස ඇයට පවුල තුළ දී දෙමාපියන්, වැඩිහිටියන් සුවිශේෂි රැකවරණයක් සැලසීම නිතැතින් ම සිදු වේ. එමෙන් ම විවාහ වීමෙන් පසු ව ස්වාමි පුරුෂයා විසින් ද භාර්යාවට සුවිශේෂි රැකවරණයක් ලබා දීම සිදු කෙරේ. බිළිඳෙකු මෙලොවට බිහි කිරීමේ පටන් ආදරය, සෙනෙහස, පෝෂණය සැලසීමෙන් හා යහපත් පුරවැසියකු ලෙස දරුවා සමාජගත කිරීමේ දී මවක ලෙස කාන්තාවගේ මෙහෙවර අතිශයින් ම ප්‍රසංශනීය වේ.

ස්ත්‍රී පුරුෂ සමානත්වතාව පිළිබඳ ව උනන්දුවක් මුල දී වර්ධනය වූයේ බටහිර රටවල යි. කාන්තාවන්ට එරෙහි ව සිදුවන විවිධ ප්‍රචණ්ඩ ක්‍රියා, නොසලකා හැරීම්, වෙනස් ලෙස සැලකීම ආදිය මේ සඳහා බල පෑ ප්‍රබල සාධක විය.

මෙවැනි කරුණු පිළිබඳ ව අවධානය යොමු වීමෙන් පසු ව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් කාන්තාව ආරක්‍ෂා කිරීම සඳහා විවිධ සම්මුතීන් ඇති විය. ඒ අතර සිඩෝ සම්මුතිය ප්‍රධාන වේ.

## කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය (සිඩෝ සම්මුතිය)

කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය සිඩෝ (CEDAW ) (Convention on the Elimination of all forms of Discrimination Against Women) ලෙස හඳුන්වයි. කාන්තාවන්ට සිදුවන සියලු ම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම මෙම සම්මුතියෙන් සිදුවන හෙයින් එනමින් ම මෙය නම් කර ඇත. එක්සත් ජාතීන් විසින් 1979 දෙසැම්බර් 18 දින මෙම සම්මුතිය සම්මත කරනු ලැබිණි. කාන්තා අයිතිවාසිකම් රැක දීම සඳහා විධිවිධාන රාශියක් මෙයට ඇතුළත් කර ඇත.

1981 සැප්තැම්බර් 03 දින සිට ක්‍රියාත්මක වන සිඩෝ සම්මුතිය පූර්විකාවකින් හා කොටස් හයක් යටතේ වගන්ති 30 කින් ද සමන්විත වේ.


එම සම්මුතියට අනුව කාන්තාවන්ට හිමි අයිතිවාසිකම් කොටස් කිහිපයක් යටතේ පෙළ ගස්වා ඇත.

- කාන්තාවන්ගේ දේශපාලන හා සිවිල් අයිතිවාසිකම්
- පවුල් ඒකකය තුළ කාන්තාවන්ගේ අයිතිවාසිකම්
- අධ්‍යාපනයට හා පුහුණු වීමට ඇති අයිතිය
- ආර්ථික කටයුතුවලට සහ එහි ප්‍රතිලාභවලට ඇති අයිතිය
- සෞඛ්‍යාරක්‍ෂාවට සහ පෝෂණයට ඇති අයිතිය
- සමාජ වෙනස්කම්වලින් ආරක්‍ෂා වීමේ අයිතිය

ශ්‍රී ලංකාව 1981 දී මෙම සම්මුතිය අත්සන් තබා පිළිගෙන ඇත. මෙම සම්මුතියට අනුව කාන්තා අයිතිවාසිකම් සුරක්‍ෂිත කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ද ගෙන ඇත.

- ◈ මෙම ජාත්‍යන්තර සම්මුතියට අනුව 1993 දී ශ්‍රී ලංකාවේ කාන්තා ප්‍රඥප්තිය සකස් කිරීම.
- ◈ කාන්තා කටයුතු සම්බන්ධයෙන් වෙන ම අමාත්‍යාංශයක් පිහිටුවීම.
- ◈ කාන්තාවන්ට වන අසාධාරණකම් සොයා බැලීම සඳහා ජාතික කාන්තා කමිටුව පිහිටුවීම.
- ◈ කාන්තාවන්ට එරෙහි ව සිදු කරන වැරදි පිළිබඳ ව දණ්ඩ නීති සංග්‍රහයට ඇතුළත් කිරීම.
- ◈ කාන්තාවන්ට ද රැකවරණ ලැබෙන ආකාරයට ඔවුන්ට එරෙහි ව නිවස තුළ දී සිදු වන ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ගෘහස්ත ප්‍රචණ්ඩත්වය පිළිබඳ පනත සම්මත කිරීම.


1999 ඔක්තෝම්බර් 06 දින සීඩෝ සම්මුතිය හා සම්බන්ධ වෛකල්පික ගිවිසුමක් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරනු ලැබී ය.



**ක්‍රියාකාරකම් 4**

01. "කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා කාන්තාවන්ගේ සමාජ මෙහෙවර" මැයෙන් රචනාවක් ලියන්න.

02. කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ ව නව යෝජනා ඉදිරිපත් කරන්න.



## ළමා අයිතිවාසිකම්

ළමා අයිතිවාසිකම් පිළිබඳ ව ලෝකයේ සුවිශේෂී අවධානයක් යොමු වුයේ පළමු ලෝක සංග්‍රාමයෙන් පසු ව යි. යුද්ධයට කිසිසේත් ම සම්බන්ධයක් නැති ලක්ෂ සංඛ්‍යාත ළමා ජනගහනයක් කුරිරු වධ හිංසාවලට ලක්වීම, අනාථභාවයට පත් වීම, මියයාම වැනි කරුණු ළමා අයිතිවාසිකම් පිළිබඳ ව අවධානය වැඩි වීමට දැඩි බලපෑමක් ඇති කළේ ය. එහෙත් ළමා ජනගහනය ආරක්ෂා කිරීමට ගත් උත්සාහයන් ක්‍රියාත්මක වීමටත් පෙර දෙවන ලෝක සංග්‍රාමය ද ඇති විය. එහි ප්‍රතිඵල පළමු ලෝක සංග්‍රාමයටත් වඩා අතිශයින් භයානක විය. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත වීමෙන් පසු ව ළමා අයිතිවාසිකම් පිළිබඳ ව ප්‍රඥප්තියක අවශ්‍යතාව දැඩි ව දැනෙන්නට විය. ළමයින් විවිධ අපචාරවලට ගොදුරු වීම, අපයෝජනයට ලක් වීම. කුරිරු වධ හිංසාවලට ලක්වීම, මෙහෙකාර සේවයේ යෙදවීම, පාසල් අධ්‍යාපනය ලබා නොදීම, යුද්ධ කටයුතු සඳහා යොදා ගැනීම, වැනි විවිධ හේතු එයට බලපා තිබේ. මේ සියලු කරුණු පදනම් කරගෙන ලෝකයට දයාද කළ සුවිශේෂි ලේඛනයක් ලෙස ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය දැක්විය හැකි ය.

මොහොතකට ඔබ ගැන සිතන්න. ඔබට කෑම, බීම, ඇඳුම් පැළඳුම් සපයා දෙන්නේ කවුරුන් ද? පාසල් යාම සඳහා අවශ්‍ය සියලු කටයුතු කර දෙන්නේ කවුරුන් ද? ලෙඩ දුක් හැදුන විට බෙහෙත් සපයා දීම, නිවසේ දී මෙන් ම ඉන් පිටත දීත් ආරක්ෂාව සැපයීම කරන්නේ කවුරුන් ද? හොඳ නරක, කළ යුතු නොකළ යුතු දේ කියා දෙන්නේ කවුරුන් ද? මේ සියල්ල ඔබේ දෙමාපියන්, වැඩිහිටියන්, ගුරුවරුන් අතින් සිදුවන බව ඔබට පැහැදිලි වනු ඇත. ඔබ හැසිරෙන විධිය, තීරණ ගන්නා ආකාරය, ඔබේ අනාගත යහපතට අවශ්‍ය දේ සඳහා මඟ පෙන්වීම ද ඔවුන් විසින් කරනු ඇත. ඒ සියල්ල ඔබ වෙනුවෙන් ඔවුන් විසින් ඉටු කරන්නේ ඔබ තවමත් අත්දැකීම් බහුල, මේරූ වැඩිහිටියකු නොවන හෙයිනි. ඔබට පෝෂණය, ආරක්ෂාව, අධ්‍යාපනය, මඟ පෙන්වීම, උදව් අවශ්‍ය සෑම විට ම සපයා දෙන්නේ ඔබ තවමත් ළමයකු වන හෙයිනි.




3.3 රූප සටහන

ඉහත 3.3 රූප සටහනේ දැක්වෙන පරිදි ළමයාගේ ආරක්ෂාව, පැවැත්ම, සහභාගීත්වය හා සංවර්ධනය යන කරුණු පිළිබඳ ව සුවිශේෂී අවධානයක් යොමු කරමින් ළමා අයිතිවාසිකම් සම්මුතිය සකස්කර තිබේ. 1989 නොවැම්බර් 20 දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මෙය සම්මත කර ඇත. සාමාජික රටවල් විසින් පිළිගැනීමෙන් පසු ව 1991 සිට ක්‍රියාත්මක වූ මෙම සම්මුතියට ශ්‍රී ලංකාව ද අත්සන් තබා ඇත.

මෙම සම්මුතිය පූර්විකාවකින් හා වගන්ති 54 කින් සමන්විත වේ. කොටස් තුනකට බෙදා ඇති එහි පළමු කොටසේ 1 සිට 41 දක්වා වගන්තිවලින් ළමයා සම්බන්ධයෙන් වන අයිතිවාසිකම් දක්වා තිබේ. දෙවන කොටස 42 වන වගන්තියේ සිට 45 වන වගන්තිය දක්වා වන අතර එමගින් සම්මුතිය ක්‍රියාත්මක වීම හා බලාත්මක වීම සම්බන්ධ කරුණු දක්වා තිබේ. තුන්වන කොටස සාමාජික රාජ්‍යයන්ගේ වගකීම සහ එක්සත් ජාතීන්ගේ කාර්යභාරය ඇතුළත් 46 වන වගන්තියේ සිට 54 වන වගන්තිය දක්වා වගන්ති නවයකින් යුක්ත වේ.

ළමා අයිතිවාසිකම් සම්මුතියට අනුව වයස අවුරුදු 18 ට අඩු සෑම මනුෂ්‍යයකු ම ළමයා යන්නෙන් අදහස් වේ.

(1 වන වගන්තිය)

දෙමව්පියන්ට සිටින උතුම් ම වස්තුව ළමයි වෙති. ඔවුහු සමාජයේ ඕනෑම කෙනෙකුගේ වැඩි ම අවධානය දිනා ගනිති. රටක අනාගත ජීවනාලිය ළමයින් වන හෙයින් ඔවුන් පෝෂණය කිරීම, රැකබලා ගැනීම, අධ්‍යාපනය ලබා දීම, සංවර්ධනය වීමට හුරු කිරීමෙන් යහපත් පුරවැසියකු බවට පත් කිරීම සැමගේ යුතුකමකි.

ළමා අයිතිවාසිකම් සම්මුතියේ තෝරාගත් වගන්ති කිහිපයක් පහත දැක්වේ. ඒවා හොඳින් කියවා බලන්න.

ළමයින් කිසිදු ආකාරයක වෙනස්කමකට භාජනය නොකිරීම, ළමයාගේ වැඩි ම යහපත සැලසීම මෙම සම්මුතියේ 2 වන හා 3 වන වගන්ති මඟින් දක්වා තිබේ.

ළමයා සම්බන්ධයෙන් මෙම සම්මුතියේ සඳහන් විධි විධාන ක්‍රියාත්මක කිරීමට සෑම සාමාජික රටකට ම වගකීමක් පැවරේ. දෙමාපියන්ගේ මඟ පෙන්වීම යටතේ ළමයාට වර්ධනය වීමට ඉඩ සලසා දිය යුතු වේ. පැවැත්ම සහ සංවර්ධනය සහතික කිරීම රජයේ වගකීමකි.

උපතේ සිට ම නමක් ලබා ගැනීමේ අයිතිය සහ ජාතියක් ලබා ගැනීමේ අයිතිය සෑම ළමයකුට ම හිමි වේ.

(1 වන වගන්තිය)

සෑම ළමයකුගේ නම, රට, පුරවැසිභාවය, පවුලේ සම්බන්ධතා ආරක්ෂා කිරීම ද රජයේ වගකීමකි. දෙමාපියන්ගෙන් වෙන් වී සිටීම, නැවත පවුලට එකතු වීම, දරුවාගේ යහපත පිණිස ම විය යුතු ය. නීති විරෝධී ලෙස ළමයින් පැහැරගෙන යාම හෝ පවරා දී ම නොකළ යුතු ය.

ළමයාට බලපාන්නා වූ කාරණාවල දී එම ළමයාගේ මතය නිදහසේ ප්‍රකාශ කිරීමේ අයිතිය ළමයකුට හිමි වේ.

(12 වන වගන්තිය)

**ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මඟින් සහතික කර ඇති තවත් අයිතිවාසිකම් රාශියකි. පහත දැක්වෙන්නේ ඒවාට උදාහරණ කිහිපයකි.**

- ප්‍රකාශන නිදහස.
- චින්තනයේ නිදහස
- හෘදය සාක්ෂියේ නිදහස.
- ආගමික විශ්වාසයේ නිදහස
- සමාගමයේ අයිතිය.
- පෞද්ගලිකත්වය ආරක්ෂා කර ගැනීමේ අයිතිය.
- තොරතුරු ලබා ගැනීමේ අයිතිය.
- ප්‍රමාණවත් ජීවන තත්වයක් ලබා ගැනීමේ අයිතිය.
- අයථා ලෙස සලකනු ලැබීම හෝ නොසලකා හැරීමෙන් වැළකීමේ අයිතිය.
- සෞඛ්‍ය හා පෝෂණය ලැබීමේ අයිතිය.

එමෙන් ම මෙම සම්මුතිය මගින් රාජ්‍යයන් ඉටුකළ යුතු වගකීම් රාශියක් ද දක්වා තිබේ. ඒවායින් කිහිපයක් පහත දැක්වේ.

- ළමයාගේ පැවැත්ම සහ සංවර්ධනය සහතික කිරීම.
- පවුල් සම්බන්ධතා ආරක්ෂා කර දීම.
- පවුල් පරිසරය අහිමි වූ දරුවන්ට ආරක්ෂාව සැලසීම.
- සරණාගත, ආබාධිත දරුවන්ට ආරක්ෂාව සැපයීම.
- සමාජ සුරක්ෂිතභාවය සැලසීම.
- ළමයාගේ උපරිම යහපත සිදුවන අයුරු නීති ක්‍රියාත්මක කිරීම.
- සන්නද්ධ අරගලවලට යොද නොගැනීම.

අධ්‍යාපන අරමුණු සාර්ථක කර ගැනීම, සුළු ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, විවේකය, විනෝද කටයුතු හා සංස්කෘතික කටයුතුවල නිරත වීමට ඇති අයිතිය, ළමා ශ්‍රමය යෙදවීම හා අනිසි ලෙස නීති විරෝධී මත්ද්‍රව්‍යවලින් ආරක්ෂා වීම, ලිංගික ක්‍රියාවල යෙදවීමෙන් ආරක්ෂා වීම, විකිණීම, රහස් වෙළෙඳම හෝ පැහැරගෙන යාමෙන් ආරක්ෂා කිරීම, වධ හිංසාවලින් නිදහස් වීම, සන්නද්ධ අරගලවලට යොද නොගැනීම වැනි අයිතිවාසිකම් රාශියක් මෙම සම්මුතිය තුළින් දක්වා තිබේ.

අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය, ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්ය විය යුතු අතර එය නොමිලයේ සෑම දෙනාට ම ලබාගත හැකි වීම.
(28 වන වගන්තිය.)

"ශාරීරික ව හා මානසික ව නොමේරූ අවධියක සිටීමේ හේතුවෙන් ළමයෙකුට උපතට පෙර මෙන් ම උපතින් පසු ව ද යෝග්‍ය නෛතික රැකවරණය ඇතුළු ව විශේෂ ආරක්ෂාවන් සහ රැකවරණය අවශ්‍ය බව තහවුරු කිරීම......."
(ළමා අයිතිවාසිකම් සම්මුතියේ පූර්විකාවෙන්)

## ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කිරීමේ දී සැලකිල්ලට යොමු වී ඇති කරුණු.

- 1924 ළමා අයිතිවාසිකම් පිළිබඳ ව ජිනිවා ප්‍රකාශනය
- 1948 මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය
- 1959 දී එක්සත් ජාතීන් විසින් සම්මත කර ගන්නා ලද ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය
- 1966 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 23 සහ 24 වගන්ති
- 1966 ආර්ථික, සමාජීය, හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 10 වන වගන්තිය
- ජාත්‍යන්තර ව දරුකමට හදා ගැනීම පිළිබඳ ව වූ 1986 දෙසැම්බර් 03 දින 41/85 දරණ එක්සත් ජාතීන්ගේ මහාමණ්ඩලයේ යෝජනා සම්මුතිය
- සන්නද්ධ අරගලවල දී ස්ත්‍රීන්ගේ හා ළමයින් ගේ ආරක්ෂාව පිළිබඳ ව වූ ප්‍රකාශනය (1974 දෙසැම්බර් මස 14 වන දින 3318 දරණ මහාමණ්ඩල යෝජනා සම්මුතිය)

"දරුවකුගේ පරිපූර්ණ වූ ද ඒකරාශී වූ ද වර්ධනය සඳහා ඔහු හෝ ඇය ප්‍රීතිමත් වූ ද ආදරයෙන් හා අවබෝධයෙන් යුක්ත වූ ද වාතාවරණයක පවුල් වටපිටාවක් තුළ ඇති දැඩි විය යුතු ය"

## ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියා මාර්ග

- ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පිළිගෙන ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංකාවේ නීති සකසන විට ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සැලකිල්ලට ගෙන නීති සම්පාදනය කිරීම
- ළමයින් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා පවත්වාගෙන යාම හා බලය පැවරීම
- සෑම පොලීසියක ම ළමයින් හා කාන්තාවන්ට අදාළ පැමිණිලි විභාග කිරීමට ළමා හා කාන්තා අංශයක් පිහිටු වීම
- 1993 1998 දණ්ඩ නීති සංග්‍රහයට ඇති කළ සංශෝධන මගින් එතෙක් පැවති නීතියට අවශ්‍ය වෙනස්කම් ඇති කිරීම

## ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සම්බන්ධ ව්‍යවස්ථා ප්‍රතිපාදනයන්හි වර්ධනය

මානව හිමිකම් සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකා ජනරජය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය කිරීමේදී මූලික අයිතිවාසිකම් වශයෙන් ඒවා ව්‍යවස්ථාවට ඇතුළත් කර තිබේ. ඒ පිළිබඳ ව කෙටියෙන් පහත දැක්වේ:

- 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවට මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයක් ඇතුළත් කිරීම.
- 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවට මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයක් ඇතුළත් කිරීම.
- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මූලික අයිතිවාසිකම් කඩ වූ විට එයට එරෙහි ව අධිකරණයේ පිහිට පැතීම සඳහා විධිවිධාන ඇතුළත් කිරීම.

මානව අයිතිවාසිකම්වල ඇතුළත් සුවිශේෂ අයිතිවාසිකම් කිහිපයක් මූලික අයිතිවාසිකම් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මගින් තහවුරු කර තිබේ. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයෙන් මෙම මූලික අයිතිවාසිකම් දක්වා තිබේ. ඒවා කෙටියෙන් පහත දැක්වේ.

## මූලික අයිතිවාසිකම්

- සෑම තැනැත්තකුට ම සිතීමේ නිදහස, හෘද සාක්ෂියේ නිදහස හා ආගමික නිදහසට හිමිකම් ඇත්තේ ය.

  (10 වන වගන්තිය)

- වධහිංසාවලට හෝ කෲර අමානුෂික අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේ ය.

  (11 වන වගන්තිය)

- 1. නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුතු ය.
  2. කිසිම පුද්ගලයකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන කිසිදු හේතුවක් මත වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොවිය යුත්තේ ය.

  (12 වන වගන්තිය)

- කිසිම පුද්ගලයකු අත්තනෝමතික ව සිරභාරයට ගැනීම නොකළ යුත්තේ ය. රඳවා තබා ගැනීම හෝ දඬුවම් කිරීම නොකළ යුත්තේ ය. අතීතයට බලපාන පරිදි දණ්ඩ නීති පැනවීම නොකළ යුත්තේ ය.


  (13 වන වගන්තිය)

- භාෂණයේ නිදහස, නීත්‍යානුකූල රැකියාවක් කිරීමේ නිදහස, සමාගමයේ නිදහස, රට තුළ යාමේ ඊමේ නිදහසට හිමිකම ඇත්තේ ය.

  (14 වන වගන්තිය)

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 සිට 14 දක්වා වගන්තිවල දක්වා ඇති මූලික අයිතිවාසිකමක් රජයේ විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් කඩවුවහොත් ඒ පිළිබඳ ව ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිලි කිරීමට ව්‍යවස්ථාවෙන් ඉඩ සලසා ඇත. මෙවැනි පැමිණිල්ලක් ඉදිරිපත් කළ යුත්තේ අයිතිවාසිකම් කඩ වී මාසයක් ඉක්මයාමට පෙර ය.

- මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධ පැමිණිල්ලක් මානව හිමිකම් කොමිසම වෙත ද ඉදිරිපත් කළ හැකි ය.
- රජයේ පරිපාලන ක්‍රියාවකින් සිදු වූ මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ මහ කොමසාරිස්වරයා හෙවත් ඔම්බුඩ්ස්මන්වරයා වෙත පැමිණිලි කළ හැකි වේ.
- මානව හිමිකම් කඩවීම සම්බන්ධයෙන් සිදුවන නඩු කටයුත්තක දී දේශීය ප්‍රතිපාදන හමාරකොට ඇති විටෙක එයින් කිසිදු සෑහීමකට පත් නොවන්නේ නම් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව වෙත ද පැමිණිලි කළ හැකි ය.



**ක්‍රියාකාරකම් - 5**

1. මානව අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ ව වාර්තා වීම් හා ඒ සම්බන්ධ ව ගනු ලැබූ පියවර පිළිබඳ ව කරුණු රැස් කරන්න.

2. මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න.

## මානව හිමිකම් භුක්ති විඳීමේ වර්තමාන තත්ත්වය හා එහි සීමා

"කෙනෙකුට සැරයටියක් වනමින් පාරේ ගමන් කළ හැකි වුවත් එම නිදහස අනෙකාගේ නාසය ළඟින් කෙළවර විය යුතු ය"

හැරල්ඩ් ලැස්කි

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය මඟින් තහවුරු කර ඇති හෝ මූලික නීතිය මඟින් හෝ වෙනත් නීති ප්‍රතිපාදන මඟින් තහවුරු කර ඇති අයිතිවාසිකම් භුක්ති විඳීමේ හිමිකමක් සැමට ම පොදුවේ හිමි වී තිබේ. එයට ජාති, ආගම්, කුල, ස්ත්‍රී පුරුෂ ආදී කිසිදු භේදයක් නොසැලකේ. එහෙත් එම අයිතිවාසිකම් භුක්ති විඳීමේ සීමාවක් හා සදචාරාත්මක බවක් තිබේ. කිසිවෙකුටත් හිතුවක්කාරී ලෙස හෝ සමාජයට හිරිහැර වන පරිදි ආත්මාර්ථකාමී ලෙස අයිතිවාසිකම් භුක්ති විඳීමේ හැකියාවක් ද නොමැත. මේ බව විසිවන සියවසේ විසූ ප්‍රසිද්ධ ඉංග්‍රීසි ජාතික දේශපාලන විද්වතෙකු වූ හැරල්ඩ් ලැස්කි ගේ ඉහත සඳහන් ප්‍රකාශනයෙන් හොඳින් පැහැදිලි වේ.

මානව හිමිකම් යටතේ විග්‍රහ කෙරෙන මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමේ සීමා පිළිබඳ ව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වන ව්‍යවස්ථාව මඟින් ද දක්වා තිබේ.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12, 13 සහ 14 වගන්තිවල සඳහන් වන කරුණු සම්බන්ධයෙන් රටේ ආරක්ෂාව, යහ පැවැත්ම, මහජන සෞඛ්‍යය, සදචාරය, ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම වැනි කරුණු මත යම් යම් සීමා පැනවීමේ හැකියාව රජය සතු වේ. නිදසුන් ලෙස රටේ දේශපාලන අස්ථාවරභාවයක් පවතින විටෙක රැස්වීමට, සමාගමයට, භාෂණයට, අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිවාසිකමට යම් යම් සීමා පැනවීමේ හැකියාව රජය සතු වේ.

එමෙන් ම වැඩ වර්ජනයක් හේතුවෙන් ජාතික ආර්ථිකයට විශාල බලපෑමක් සිදුවේ නම් එවැනි අවස්ථාවක වෘත්තීය සමිති පිහිටුවා ගැනීමට හා ඒවායේ කටයුතු කිරීමට ඇති අයිතිවාසිකමට සීමා පැනවීමට රජයට හැකි වේ.

අන් අයගේ අයිතිවාසිකම් ආරක්‍ෂා වීම පිණිස සහ ආධ්‍යාත්මික ගුණ වගාව වැඩි දියුණු වීම පිණිස අයිතිවාසිකම්වලට සීමා තිබිය යුතු ය. එමෙන් ම එක්සත් ජාතීන්ගේ පරමාර්ථ හා ප්‍රතිපත්තිවලට පටහැනි වන ආකාරයට මෙම අයිතිවාසිකම් භුක්ති විඳීම නොකළ යුතු ය.

කිසිවෙකුටත් තවත් කෙනෙකුගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන අයුරින් හැසිරීමට අයිතියක් නැත. එක් අයෙකුගේ අයිතිවාසිකම් රැක ගැනීමට නම් අනෙක් අය විසින් තම යුතුකම් ඉටු කිරීම ද අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ දී ඉතා වැදගත් වේ. එක් එක් අය අයිතිවාසිකම් ලෙස පෞද්ගලික ව අපේක්ෂා කරන දේ ඉටු වන්නේ පොදුවේ එකිනෙකාගේ අන්‍යෝන්‍ය යුතුකම් ඉටු කිරීම මත ය. එබැවින් අයිතිවාසිකම් ඉල්ලීමට වඩා යුතුකම් ඉටු කිරීම සමාජයේ යහ පැවැත්මට බෙහෙවින් උපකාරී වේ.

## මානව අයිතිවාසිකම් සුරැකීමෙහිලා පුරවැසියන්ගේ යුතුකම්

පැරණි ආසියාතික සමාජයේ "අයිතිවාසිකම්" යන සංකල්පය එතරම් ජනප්‍රිය නොවුණි. එහෙත් "යුතුකම්" පිළිබඳ ව වැඩි අවධානයක් යොමු වී තිබුණි. ඒ අනුව යුතුකම් ඉටු කිරීමෙන් අයිතිවාසිකම් ලැබෙන බව ආසියානුවන්ගේ විශ්වාසය යි. එලෙස ම "යුතුකම්" යන්න "වගකීම්" ලෙස ද පිළිගැනීමක් පවතී. එය යුතුකම් හා වගකීම් වෙන්කර හඳුනා ගැනීමට ද අපහසුතාවයක් ඇති කර තිබේ. කෙසේ වුව ද මානව අයිතිවාසිකම් සුරැකීමෙහි ලා පුරවැසියන්ගෙන් ඉටු විය යුතු යුතුකම් රැසක් පවතී. ඒ පිළිබඳ ව මෙහි දී සාකච්ඡා කෙරේ.

1948 එක්සත් ජාතීන් විසින් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයක් සම්මත කිරීමට පෙර ශ්‍රී ලාංකිකයන් කිසිවිටෙකත් අයිතිවාසිකම් පිළිබඳ මේ තරම් උනන්දු නොවී ය. ඔවුන් සැම විට ම උනන්දු වූයේ තම වගකීම් හා යුතුකම් නොපිරිහෙළා ඉටු කිරීමට යි. විශේෂයෙන් ම ආසියානු කලාපීය රටවල පැවති යුතුකම් ඉටු කිරීම පිළිබඳ සදාචාරාත්මක සමාජ බැඳීම ඉතා ඉහළ මට්ටමක පැවතුණි. සෑම කටයුත්තක දී ම පවුලේ සමාජිකයන් අසල්වැසියන් මෙන් ම පොදුවේ සමාජය වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමේ අවශ්‍යතාව එහි වැදගත්කම ජනතාව වටහා ගෙන තිබුණි. දුක සැප දෙකෙහි දී ම සමඟියෙන්, සහජීවනයෙන් හා සමානාත්මතාවයෙන් කටයුතු කිරීම ජීවිතයේ එක් වැදගත් අංගයක් විය. පාරම්පරික සිරිත්, විරිත්, සම්ප්‍රදයයන්, සංස්කෘතිය හා බැඳුණු හර පද්ධතීන් එයට බෙහෙවින් බලපා තිබේ. ජාතියක් වශයෙන් නැඟී සිටීම සඳහා තමා වෙත පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීමේ වගකීම අවබෝධය කරගෙන තිබුණි. මේ නිසා ඉන්දියාව,

ශ්‍රී ලංකාව වැනි ආසියාතික රටවල යුතුකම් හා වගකීම් පිළිබඳ ව බැඳීම ජනතාවට උපතින් ම උරුම වී තිබුණි. මේ නිසා අයිතිවාසිකම් පිළිබඳ විශේෂයෙන් උනන්දු වීමේ අවශ්‍යතාවක් පැන නො නැගුණි. එක් එක් අය විසින් තම තමන්ගේ යුතුකම් හා වගකීම් ඉටු කිරීමෙන් නිරායාසයෙන් ම සැමගේ අයිතිවාසිකම් සුරක්ෂිත වීම සිදු විය. එය මිනිසුන් සම්බන්ධයෙන් පමණක් නොව සතුන් සම්බන්ධයෙන් ද මැනවින් ඉටු විය. පරිසරයට දැක්වූයේ ද එවැනි ම අසීමිත ආදරයකි. පරිසරයෙන් රැකුණු මිනිසා පරිසරය සුරැකීමට ද තම යුතුකම් ඉටු කරමින් පරිසරය රැක බලා ගැනීමට ද පුරුදු විය.

පසු කාලීන ව බටහිර රටවල යටත් විජිත පාලනයට පත්වීමෙන් පසු ව ඇති වූ තත්ත්වයන් මත පෙරදිග පැවති ශ්‍රේෂ්ඨ සංස්කෘතිය ක්‍රමයෙන් බිඳීයාම ඇරඹිණි. බටහිර ආභාසයේ මුසුවීමත් සමඟ යුතුකම් හා වගකීම් පිළිබඳ ව වූ එළඹුම අයිතිවාසිකම්වලට පරිවර්තනය විය. යුතුකම් හා වගකීම් ඉටු කිරීමට වඩා තම අයිතිවාසිකම් දිනා ගැනීමට පෙළඹීම එහි ප්‍රතිඵලය විය. එහෙත් අයිතිවාසිකම් පිළිබඳ ව තනි තනිව සලකා බැලුවහොත් එය නැවතත් ඉටුකර ගැනීමට හැකිවන්නේ තම යුතුකම් හා වගකීම් මැනවින් ඉටු කිරීමෙන් පමණි. ඔබට ඔබේ අයිතිවාසිකම් රැක ගැනීමට අවශ්‍ය වනවා මෙන් ම අනෙක් අයට ද ඔවුන්ගේ අයිතිවාසිකම් රැක ගැනීමේ අවශ්‍යතාවක් තිබේ. එයට අයිතියක් ද තිබේ. එබැවින් ඔබේ අයිතිවාසිකම් රැක ගැනීමට නම් ඔබේ යුතුකම් ද ඉටු කළ යුතු ව ඇත. මේ පිළිබඳ ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ද "මූලික යුතුකම්" යටතේ කරුණු දක්වා තිබේ.

## මූලික යුතුකම්

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ද අයිතිවාසිකම් පිළිගෙන සුරක්ෂිත කර තිබේ. එමෙන් ම යුතුකම් පිළිබඳ ව ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර තිබේ. මේවා මූලික යුතුකම් ලෙස හැඳින්වේ. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වන වගන්තිය මගින් මෙම මූලික යුතුකම් පිළිබඳ ව දක්වා තිබේ.

## 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වගන්තියෙහි සඳහන් මූලික යුතුකම්.

"අයිතිවාසිකම් සහ නන්වැදෑරුම් නිදහස ක්‍රියාත්මක වීමත් භුක්ති විඳීමත් යුතුකම් හා බැඳීම් ඉටු කිරීමෙන් වෙන් ව පැවතිය නො හැක්කේ ය. එහෙයින්,

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීතිය ආරක්ෂාකොට අනුගමනය කිරීම.

(ආ) ජාතික අභිවෘද්ධිය ඇති කිරීම හා ජාතික සමගිය පෝෂණය කිරීම.

(ඇ) තමන් විසින් තෝරාගනු ලැබූ රැකියාවෙහි හෘදය සාක්ෂියට එකඟ ව නොපිරිහෙළා වැඩ කිරීම.

(ඈ) පොදු දේපල සුරක්ෂිත කොට ආරක්ෂා කිරීම ද, පොදු දේපළ අයථා පරිදි ප්‍රයෝජනයට ගැනීමට සහ නාස්ති කිරීමට එරෙහි ව ක්‍රියා කිරීම.

(ඉ) සෙසු අයගේ අයිතිවාසිකම් සහ නිදහස ගරු කිරීම.

(ඊ) ස්වභාව ධර්මය හා ස්වාභාවික සම්පත් රැක ගැනීම ද ශ්‍රී ලංකාවාසී සෑම තැනැත්තෙකුගේ ම යුතුකම වන්නේ ය."

ජාතියක් වශයෙන් නැගී සිටීම සඳහා පුරවැසියන්ගේ කාර්යභාරය සම්බන්ධයෙන් මූලික යුතුකම් කොටස ඉටු කිරීම ඉතා වැදගත් වේ. "රටෙන් අපට ලැබෙන්නේ මොනවා ද යන්න පිළිබඳ ව විමසනවාට වඩා අපෙන් රටට ඉටු විය යුත්තේ කුමක් ද" යන්න පිළිබඳ ව විමසිලිමත් වී එය ඉටු කිරීම සැමගේ යුතුකම වේ. පුරවැසියකු වශයෙන් තම රටට ජාතියට ඉටු විය යුතු මෙහෙවර ඉටු කිරීමේ දී අයිතිවාසිකම් ඉල්ලා සිටීම පිළිබඳ ව ගැටලුවක් මතු නො වේ. සියල්ලන් ම යුතුකම් ඉටු කරන තරමට සියල්ලන්ගේ ම අයිතිවාසිකම් සුරක්ෂිත වීම සිදු වේ. මෙහි දී වැදගත් වන්නේ තමන් ජනිත වූ මාතෘ භූමිය වෙනුවෙන් මගේ යුතුකම් කොටස ඉටු කිරීමට මට අවස්ථාව ලැබෙන්නේ කවද ද, කොතැන දී ද යන්න පිළිබඳ ව විමසිලිමත් වී එය නොපිරිහෙළා ඉටු කිරීම යි.

## යුතුකම් ඉටු කළ යුත්තේ කෙසේ ද? කවුරුන් ලෙස ද?

ඔබට යුතුකම් ඉටු කිරීමට ලැබෙන අවස්ථා පිළිබඳ ව සිතන්න. ඒවා ඉටු කිරීමේ දී ඔබට විවිධ භූමිකා නිරූපණය කිරීමට සිදු වේ. ඒ ඔබ සමාජයේ සාමාජිකත්වය දරන විවිධ අවස්ථා අනුව යි. පහත දැක්වෙන්නේ එවැනි අවස්ථා කිහිපයකි.

### 1. පවුලේ සාමාජිකයෙක් ලෙස :-

ඔබ මෙලොවට බිහිකර කවා පොවා ඇති දැඩි කර, ආරක්ෂාව, ආදරය, සෙනෙහස ලබා දී ඔබට අධ්‍යාපනය ලබා දීමට කටයුතු කරන ඔබ වෙනුවෙන් වෙහෙසෙන දෙමව්පියන්, සහෝදර සහෝදරියන් වෙනුවෙන් පවුලේ සාමාජිකයකු ලෙස ඉටු කළ යුතු බොහෝ යුතුකම් තිබේ. ඒවා හැකි පමණින් නොපිරිහෙළා ඉටු කළ යුතු වේ. මැනවින් ඉගෙන ගැනීම, දෙමාපියන්ට, වැඩිහිටියන්ට කීකරු වීම, ඔවුන්ට උදව් කිරීම, බාල සහෝදර සහෝදරියන් රැක බලා ගැනීමට උදව් කිරීම වැනි දෑ එවැනි යුතුකම් කිහිපයකි.



3.4 රූප සටහන
දෙමව්පියන්ට උදව් කරන අවස්ථාවක්

### 2. පාසලේ සාමාජිකයෙක් ලෙස :-

පාසලේ නිත්‍ය සාමාජිකයකු වන ඔබ පාසල වෙනුවෙන් ඔබේ යුතුකම් කොටස මැනවින් ඉටු කළ යුතු වේ. දෙමාපියන්ගේ මෙන් ම ගුරු දෙමව්පියන්ගේ ද ලොකු ම බලාපොරොත්තුව වන්නේ ඔබ යහපත් පුරවැසියකු වනු දැකීම යි. ඒ සඳහා මැනවින් කීකරු ව ඉගෙනීමේ කටයුතුවල යෙදීම ඔබගේ ප්‍රධානතම යුතුකම වේ. හොඳ විනයක් හා ශික්ෂණයක් ඇති ව කටයුතු කිරීම පාසලේ කීර්තිය පැතිරවීමට



3.5 රූප සටහන
පාසලේ වැට සකස් කරන සිසුන් පිරිසක්

කටයුතු කිරීම, පාසලේ සංවර්ධනයට උදව් කිරීම, පාසලේ දේපළ ආරක්ෂා කිරීම, පංති කාමරය, පාසල් වත්ත පිරිසිදු ව තබා ගැනීමට උදව් වීම, ගුරුවරුන්ට ගෞරව කිරීම, සහෝදර සිසුන් සමග සහජීවනයෙන්, සමගියෙන් හා සමානාත්මතාවයෙන් කටයුතු කිරීම පාසලට ඔබෙන් ඉටු විය යුතු යුතුකම් කිහිපයකි.

## 3. උසස් අධ්‍යාපන ආයතනවල දී

පාසල් අධ්‍යාපනය නිමවීමෙන් පසු ව ඔබ වෙනත් විවිධ අධ්‍යාපන ආයතනවල සාමාජිකත්වය ලබනු ඇත. එහි දී විවිධ පර්යේෂණවල නියැලෙමින් මැනවින් අධ්‍යාපන කටයුතුවල නියුක්ත විය යුතු ය. තමන් අධ්‍යාපනය ලබන ආයතනයට කීර්තියක් අත්කර දීම තමාගේ අධ්‍යාපන කටයුතු සඳහා වෙහෙසෙන දෙමාපියන්, ගුරුවරුන්, සුබපතන්නන්ගේ බලාපොරොත්තු ඉටු කරලීම සඳහා යහපත් පුරවැසියකු ලෙස සමාජයට වැඩදායක වීම සඳහා වෙහෙසීම ඔබෙන් ඉටු විය යුතු යුතුකම්වලට උදාහරණ කිහිපයකි.



3.6 රූප සටහන
පර්යේෂණයක යෙදෙන සිසුන්

## 4. රැකියාවක නියුක්ත වීමේ දී

ඔබ අධ්‍යාපනය හැදෑරීමෙන් පසු ව විවිධ රැකියා සඳහා යොමු විය හැකි ය. සමහර විට කම්හලේ, වැඩපළේ, කුඹුරේ, පාරේ, ඉඩමේ, කාර්යාලයේ ආදී ඕනෑම තැනක ඔබ රැකියාව සඳහා යොමු විය හැකි ය. රැකියාව කුමක් වුවත්, ස්ථානය කුමක් වුවත් තමා වෙත පැවරී ඇති කටයුතු නොපිරිහෙළා ඉටු කිරීම ඉතා වැදගත් වේ. අභිමානවත් ජාතියක් වශයෙන් නැගී සිටීම සඳහා තම මෙහෙවර ඉටු කිරීමට සෑම විට ම අධිෂ්ඨාන කරගත යුතු වේ.



3.7 රූප සටහන
ගොයම් පැළ සිටුවන අවස්ථාවක්

## 5. සමාජයේ සාමාජිකයෙක් ලෙස :-



3.8 රූප සටහන
ශ්‍රමදානයක යෙදෙන පිරිසක්

ඔබ දැනටමත් පාසලේ මෙන් ම විවිධ සමාජ සංවිධානවල සාමාජිකයකු විය හැකි ය. ඒ කිසි තැනක නැතත් සාමාන්‍ය සමාජයේ ඔබ ද සමාජිකයෙකි. ඔබ අද සිටින තැනට පැමිණීම සඳහා සමාජයේ සියල්ලන්ගේ ම ආදරය, කරුණාව, උදව් විවිධාකාර ව ඔබට ලැබී ඇත. ඒ ගැන සිතා බලන්න. ඒ සැම වෙනුවෙන් ම යහපත් පුරවැසියෙකු වශයෙන් මෙන් ම හොඳ අසල්වැසියකු, ඥාතියෙකු වශයෙන් ඔබ වෙත පැවරී ඇති යුතුකම් ඉටු කිරීම ඉතා වැදගත් වේ. පොදු කටයුතුවල නිරතවීම ද එහි දී වැදගත් වේ. එමෙන් ම සමාජයේ ආරක්ෂාව සඳහා සිටින ත්‍රිවිධ හමුදාවට හා පොලීසියට උදව් කිරීම, ජාතික ආරක්ෂාව සඳහා කටයුතු කිරීම ද මෙහි දී ඉතා වැදගත් යුතුකම් කිහිපයකට උදාහරණ වේ.

විශේෂයෙන් ම ශ්‍රී ලාංකිකයන් වන අපි නිදහස් අධ්‍යාපනය ලබා ගැනීමට වාසනාවන්ත වී සිටිමු. එහෙත් අපට නොමිලයේ ලැබෙන සියල්ල වෙනුවෙන් විශාල ජාතික ධනයක් වැය කෙරේ. එය මේ රටේ දුප්පත් පොහොසත් භේදයකින් තොර ව දිවා රෑ වෙහෙසෙන ජනතාවගේ ආදයම් කොටසකි. ඒ නිසා එම මුදල් වැය කර ඉගෙන ගන්නා අප කිසිදු පෞද්ගලික ප්‍රතිලාභයක් නැතත් අපේ මව්බිම වෙනුවෙන් සේවය කළ යුතු ය. එය අද දවසේ අභිමානවත් පුරවැසියෙකු වශයෙන් ශ්‍රී ලාංකිකයන්ගේ පරම යුතුකම වේ.

**ක්‍රියාකාරකම් - 6**

01. පුරවැසියෙකු වශයෙන් රටට ඉටු විය යුතු යුතුකම් පිළිබඳ ලැයිස්තුවක් සකස් කරන්න. එවැනි යුතුකම් ඉටු කිරීමෙන් ඔබ ළඟා කර ගැනීමට අපේක්ෂා කරන දේ පැහැදිලි කරන්න.

02. පාසලේ ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක ලෙස ඔබට පාසල වෙත ඉටු කළ හැකි යුතුකම් මොනවා ද යි සොයා බලන්න. පාසලේ සංවර්ධනයට ඉන් ලැබෙන දයකත්වය කුමක් ද යි පැහැදිලි කරන්න.

## ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකුගේ කාර්යභාරය

ලෝකයේ බෝහෝ රටවල් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයකට උරුමකම් කියන ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයකට හුරු වූ ජන සමූහයකින් සමන්විත වේ. එවැනි සමාජයක වැදගත් ම සාධකය වන්නේ එහි ජීවත්වන පුද්ගලයෝ වන පුරවැසියෝ ය. ශ්‍රී ලාංකිකයන් වන අපි ද එවැනි ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ජීවත් වෙමු. ඕනෑම කටයුත්තක දී ප්‍රජාතන්ත්‍රවාදී ව කටයුතු කිරීමත්, ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග ප්‍රදර්ශනය කිරීමත් සමාජයක යහපත සඳහා ඉතා වැදගත් වේ.

අප ජීවත්වන සමාජය විවිධ වූ විෂමතාවලින් පිරී තිබේ. අතිශයින් සංකීර්ණ ය. පුද්ගලයාගෙන් පුද්ගලයාටත්, පවුලෙන් පවුලටත් ප්‍රදේශයෙන් ප්‍රදේශයටත් වෙනස්කම් දැකිය හැකි ය. විවිධ ජනවර්ග, ආගම්, රැකියා, වෘත්තීන් නියෝජනය කරන පිරිස් හා විවිධ දේශපාලන මත දරන පිරිස් ඒ අතර සිටිති. සිතුම් පැතුම් විවිධාකාර ය. මේ නිසා එක ම කරුණක් සඳහා වුවත් විවිධ මත ප්‍රකාශ කරන වෙනස් ආකාරයෙන් ප්‍රතිචාර දක්වන පිරිස් ඒ අතර සිටිති. එහෙත් සියල්ලන් ම සාමයෙන්, සමඟියෙන් හා සමානාත්මතාවයෙන් යුක්ත ව නීතිගරුක පුරවැසියන් ලෙස එකිනෙකාට ගරු කරමින් පෞද්ගලික හා පොදු අපේක්ෂා ඉටු කරමින් සාර්ථක ජීවිතයක් ගත කරන පිරිසක් වනු දැකීම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක අපේක්ෂාව යි.

නිවසේ දී පවුලේ ගුණ ගරුක සාමාජිකයකු ලෙසත්, පාසලේ දී විනය ගරුක ක්‍රියාශීලී ශිෂ්‍යයකු හෝ ගුරුවරයෙකු ලෙසත්, ජීවත් වන ගමේ හෝ නගරයේ දී සුහදශීලි අසල්වැසියෙකු ලෙසත්, රැකියාවේ හෝ වෘත්තීයේ නියැළීමේ දී අවංක අනලස් ඵලදායී සේවකයෙකු සේව්‍යයකු ලෙසත් ආදී වශයෙන් විවිධ භූමිකා නියෝජනය කිරීමට අපට සිදු වේ. එහි දී එක් එක් අවස්ථාවට අනුරූප ව තම කාර්යභාරය නොපිරිහෙළා ඉටු කිරීම හා කැපවීමෙන් කටයුතු කිරීම ඉතා වැදගත් වේ. ශ්‍රී ලාංකිකයන් වශයෙන් අප එක ම ජාතියක් වශයෙන් නැගී සිටීම සඳහා අභිමානවත් පුරවැසියකු ලෙස ඒ ඒ අවස්ථාවේ දී පැවරෙන කාර්යයන් හැකි උපරිම අයුරින් ඉටු කිරීම සඳහා ඒ සම්බන්ධයෙන් ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු ලෙස ප්‍රගුණ කළ යුතු, ප්‍රදර්ශනය කළ යුතු ගුණාංග රාශියකි.

### යහපත් පුරවැසියකු ලෙස ප්‍රගුණ කළ යුතු ගුණාංග කිහිපයක්

- විනය ගරුක වීම.
- අන් අයගේ අයිතීන් පිළිගැනීම හා යුතුකම් ඉටු කිරීම.
- සාකච්ඡා කිරීමෙන් ගැටලු විසඳා ගැනීම.
- අන් අයට හා ඔවුන්ගේ මතවලට ගරු කිරීම.
- නීතිගරුක ව හා සාමකාමී ව හැසිරීම.
- පොදු දේපළ ආරක්ෂා කිරීම.
- ජාතික උරුම, ස්වාභාවික සම්පත් රැකගැනීම හා පෝෂණය කිරීම.

මානව ගුණධර්ම රකිමින් පෞද්ගලික ව තමාගේත් තම පවුලේ හා රටේත් අනාගත සුබ සිද්ධිය උදෙසා යහපත් කටයුතුවල නිරත වීම, මැනවින් තම යුතුකම් ඉටු කරමින් අයිතිවාසිකම් භුක්ති විඳීම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු වශයෙන් ඉටු කළ යුතු වැදගත් කාර්යන් වේ.

## ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකුගේ යුතුකම්

සමාජයේ යහපැවැත්ම සඳහා පුරවැසියකු වශයෙන් ඉටුකළ යුතු යුතුකම් රාශියකි. එය පෞද්ගලික ව තමාගේත්, පොදුවේ සමාජයේත් අභිවෘද්ධිය සඳහා ඉවහල් වේ. එවැනි යුතුකම් කිහිපයක් පහත දැක්වේ.

## යුතුකම්

| සදාචාරාත්මක ව ඉටු කළ යුතු යුතුකම් | නීතිමය වශයෙන් ඉටු කළ යුතු යුතුකම් |
|---|---|
| • දෙමව්පියන්ට සැලකීම<br>• ගුරුවරුන්ට සැලකීම<br>• පූජක උතුමන්ට සංග්‍රහ කිරීම.<br>• වැඩිහිටියන්ට ගරු කිරීම හා සැලකීම.<br>• සිරිත්විරිත් සම්ප්‍රදායයන් ගරු කිරීම හා රැකීම.<br>• ගිලනුන්ට, විශේෂ අවශ්‍යතා ඇති අයට උපකාර කිරීම.<br>• අවශ්‍ය අවස්ථාවල දී අන්‍යයන්ට උපකාර කිරීම.<br>• පරිසරය සුරැකීම<br>• ජාතික උරුම, ජාතික සම්පත්, සංස්කෘතිය සුරැකීම<br>• රට දැයට විශිෂ්ට සේවයක් කළ පුරවැසියන්ට උපහාර පිදීම. | • රාජ්‍යයට පක්ෂපාතී වීම.<br>• පනවා ඇති හෝ පනවන නීතිරීතිවලට ගරු කිරීම<br>• නීතිය හා සාමය පවත්වා ගැනීමට සහාය වීම<br>• පොදු දේපළ සුරක්ෂිත කිරීම<br>• අයබදු ගෙවීම<br>• ත්‍රස්තවාදය පිටු දැකීමට ක්‍රියා කිරීම.<br>• ත්‍රස්තවාදී ක්‍රියාවල හෝ අපරාධවල නියැලෙන්නන් නීතියේ රැහැනට හසුකර ගැනීම සඳහා ත්‍රිවිධ හමුදාවට හා පොලීසියට කැප වීමෙන් සහාය වීම. |

3.2 වගුව

## සාරාංශය

- පොදුවේ සෑම මනුෂ්‍යයෙකුට ම තිබිය යුතු යැයි සැලකෙන අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් ලෙස හඳුන්වයි.
- අයිතිවාසිකම් සදාචාරාත්මක සංකල්පයක් වුවත් වර්තමානයේ දී එයට නීතිමය තත්ත්වයන් හිමි වී තිබේ.
- සිවිල්, දේශපාලන, ආර්ථික, සමාජීය හා සංස්කෘතික වශයෙන් අයිතිවාසිකම් වර්ග කළ හැකි ය.
- මානව අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා මිනිසා විවිධ අවස්ථාවල අරගල සිදු කර තිබේ.
- ලෝකයේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීහු ක්‍රියා කරමින් සිටිති.
- මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සකස් කරනු ලැබිණි.
- මානව හිමිකම් විශ්ව ප්‍රකාශනයට නීතිමය තත්ත්වයක් ඇති කරලීම සඳහා සහ අයිතිවාසිකම් පැහැදිලි ව වෙන්කර දැක්වීම සඳහා එක්සත් ජාතීන් විසින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය හා ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කරනු ලැබිණි.
- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ව සම්මුතියට වෛකල්පික ගිවිසුම් 2ක් ද ඉදිරිපත් වී තිබේ.
- ළමා අයිතිවාසිකම් විශේෂ කොට සලකා සුරක්ෂිත කිරීම සඳහා ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මක වේ.
- කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා සීඩෝ සම්මුතිය ඇතුළු විවිධ සම්මුතීන් සම්මත කර තිබේ.
- ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ම කටයුතු කර ඇති අතර එයට අමතර ව විවිධ ක්‍රියා මාර්ග ගෙන තිබේ.
- අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා සෑම පුරවැසියකු ම තම වගකීම් හා යුතුකම් මැනවින් ඉටු කළ යුතු ය.